# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2042/10 - 2017 ඔක්තෝබර් මස 24 වැනි අඟහරුවාදා - 2017.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

2017 වර්ෂයේ අංක 04 දරන උතුරු පළාත් මුදල් (සංශෝධිත) ප්‍රඥප්තිය

උතුරු පළාතේ පළාත් සභාව විසින් 2017 වර්ෂයේ මැයි මස 25 වෙනි දින සම්මත කරන ලද 2017 වර්ෂයේ අංක 04 දරන උතුරු පළාත් මුදල් (සංශෝධිත) ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2017 වර්ෂයේ ඔක්තෝබර් මස 13 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙමගින් දැනුවත් කරනු ලැබේ.

කේ. තෙයිවේන්ද්‍රම්,
ලේකම්,
උතුරු පළාත් සභාව.

2017 ඔක්තෝබර් මස 17 වැනි දින,
ඒ 9 මාර්ගය,
කයිතඩි,
සභා ලේකම් කාර්යාලයේ දී ය.

**2017 වසරේ අංක 04 දරන උතුරු පළාත් මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

***2014 වසරේ අංක 01 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි නීති පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ 2017 වසරේ අංක 04 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර උතුරු පළාතේ ගරු ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලැබුණු දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය. (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)

2. 2014 වසරේ අංක 01 දරන උතුරු පළාත් මුදල් ප්‍රඥප්තියේ 37 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය ඒ හා සමග පහත සඳහන් නව උපවගන්තිය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ. (මුල් ප්‍රඥප්තියේ 37 වැනි වගන්තිය සංශෝධනය කිරීම.)

   "2 අ. 1972 වසරේ අංක 5 දරන සමුපකාර සමිති පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් සමුපකාර සමිතියක් විසින් හෝ එම සමිතිය වෙනුවෙන් හෝ එම සමිතිය උදෙසා කරනු ලබන නිශ්චල දේපළ වල හිමිකම පැවරීම හෝ හුවමාරු කිරීම,

3. මෙම ප්‍රඥප්තියේ දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂා අතර යම් අසංස්ථිතියක් පවතින විටක, දෙමළ භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. (යම් අසංස්ථිතියක් ඇති වුවහොත්, දෙමළ භාෂා පාඨය බල පැවැත්වෙන බව.)

11 - 420


1A - PG 3731 — 27 (2017/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*